# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## අධ්‍යාපන පීඨය

## පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (සති අන්ත) පරීක්ෂණය - 2019

## අධ්‍යාපන මූලධර්ම හා ගැටලු

**පැය තුනයි**

**'අ' කොටසින් <u>පළමුවන ප්‍රශ්නය ඇතුළුව</u> තවත් ප්‍රශ්න <u>දෙකකටද</u> 'ආ' කොටසින් <u>හයවන</u> ප්‍රශ්නය <u>ඇතුළුව</u> තවත් ප්‍රශ්න <u>දෙකකට</u> ද වශයෙන් ප්‍රශ්න <u>හයකට</u> පිළිතුරු සපයන්න.**

- **එක් එක් කොටසට අදාළ පිළිතුරු වෙන වෙනම පොත්වල ලියා වෙන වෙනම අමුණා බාර දෙන්න.**
- **ඒ ඒ පිළිතුරු පොත්වල මුල් පිටුව ඉහළ දකුණු කෙළවරේ කුමන කොටස ද යන්න විෂයයේ නම සමග සඳහන් කරන්න.**
- **01 සහ 06 වන ප්‍රශ්නවලට ලකුණු 20 බැගින් ද අනෙකුත් ප්‍රශ්නවලට ලකුණු 15 බැගින් ද වෙන් කර ඇත.**

University of Colombo
Library
Sri Lanka

### <u>අ කොටස - දාර්ශනික මූල ධර්ම</u>

1\.

i. ඉගෙනුම් සමාජයක (Learning Society) දැකිය හැකි ලක්ෂණ <u>හතරක්</u> ලියන්න.

ii. අධ්‍යාපන සංකල්පය පිළිබඳව ලබා දී ඇති නිර්වචන අතර විවිධත්වයක් පැවතීම කෙරෙහි බලපාන හේතු <u>හතරක්</u> ලියන්න.

iii. "භෞතික ලෝකය නොව අධ්‍යාත්මික ලෝකයම සත්‍ය වේ" (Spiritual world is real, not the material world) මෙම ප්‍රකාශය කිනම් දාර්ශනික ගුරුකුලයකට අයත් වේ ද? මෙහි අර්ථය සැකෙවින් දක්වන්න.

iv. ගෝලීයකරණ ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් වශයෙන් අධ්‍යාපනයට ඇතිකරන අභියෝග <u>හතරක්</u> ලියන්න.

v. බෲබකර් විසින් හඳුන්වා දුන් "ප්‍රත්‍යාවේක්ෂණය (Speculative Function) යන විධායක කාර්යය (Prescriptive Function) යන්නෙහි අර්ථය සැකෙවින් පැහැදිලි කරන්න.

(ලකුණු $4 \times 5$ = ලකුණු 20)

2. i. ශ්‍රී ලංකාවේ ජාතික අධ්‍යාපනයේ මූලික නිපුණතා සහ පොදු අරමුණු වත්මන් සමාජ-ආර්ථික අභියෝග ජයගැනීම සඳහා කොතෙක් දුරට දායක වන්නේදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 7)

ii. එම මූලික නිපුණතා සහ පොදු අරමුණු ඉටුකර ගැනීමට ඔබ උගන්වන විෂය තුළින් ලබාදෙන දායකත්වය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 8)

3. i. අධ්‍යාපනයේ ස්වභාව ධර්මවාදය සහ උපයෝගිතාවාදය පහත තේමාවන් ඔස්සේ තුලනාත්මකව සන්සන්දනය කරන්න.

A. දාර්ශනික මූලධර්මය

B. අධ්‍යාපන අරමුණු

C. විෂයමාලාව

D. ඉගැන්වීම් ක්‍රම (ලකුණු 8)

ii. මෙම දාර්ශනික න්‍යායන් මගින් පෙන්වා දෙනු ලබන අදහස් ශ්‍රී ලංකාවේ වත්මන් අධ්‍යාපනයට දායක කර ගෙන ඇති ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 7)

4. i. "අධ්‍යාපනය සැබැලෙසට ක්‍රියාත්මක වන්නේ සැබෑ දාර්ශනිකයකු අතින්ම පමණය" (True Education is practicable only to true philosopher) මෙම කියමනෙහි අදහස පැහැදිලි කරන්න. (ලකුණු 7)

ii. වත්මන් ශ්‍රී ලාංකික අධ්‍යාපනය සඳහා ලැබෙන දාර්ශනික මගපෙන්වීම (යම් දර්ශනයක් මත පෝෂණය වී තිබේද) පිළිබඳ ඔබේ අදහස පැහැදිලි කරන්න.

(ලකුණු 8)

5. i. චරිතායන අධ්‍යාපනයෙහි අවශ්‍යතාව පෙන්වාදී ඒ සඳහා අනුගමනය කළ යුතු අධ්‍යාපන මූලධර්ම පෙන්වා දෙන්න. (ලකුණු 8)

ii. චරිතායන අධ්‍යාපනය පාසල තුළ ක්‍රියාත්මක කළ හැකි ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 7)

## ආ කොටස - අධ්‍යාපන සමාජවිද්‍යා මූලධර්ම

6. i. මහා සංස්කෘතිය හා උපසංස්කෘතිය අතර වෙනස හා සම්බන්ධය හඳුන්වන්න.

ii. පාසලින් සංස්කෘතිය පවරාදෙන ආකාරය පෙන්වා දෙන්න.

iii. වර්තමාන සමාජයේ පොදු සමාජ සචලනයට බලපාන හේතු හතරක් දක්වන්න.

iv. වර්තමාන ගුරු භූමිකාව අතීත ගුරු භූමිකාවට වඩා වෙනස්වීමට බලපාන ලද හේතු හතරක් ඉදිරිපත් කරන්න.

v. ගුරුවරයාගේ සමාජ භූමිකාව ශිෂ්‍ය භූමිකාවට බලපාන ආකාරය උදාහරණ සහිතව දක්වන්න.

(ලකුණු 4×5 = ලකුණු 20)

7. i. විධිමත් සමූහයක කැපීපෙනෙ ලක්ෂණ හඳුන්වා, ඒවා පාසල තුළ ක්‍රියාත්මක වන ආකාරය යථාර්ථවාදී ලෙස විග්‍රහ කරන්න. (ලකුණු 7)

ii. අවිධිමත් සමූහ පාසලේ ක්‍රියාවලියට බලපාන ආකාරය දක්වා, එම සමූහ පාසලේ ක්‍රියාවලියට හිතකර ලෙස හසුරුවා ගන්නා අන්දම පැහැදිලි කරන්න.

(ලකුණු 8)

8. i. සමාජ ස්තරායනය හා අධ්‍යාපන අවස්ථා අතර සම්බන්ධය පර්යේෂණ අනාවරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 7)

ii. අධ්‍යාපනයෙන් සමාජ සචලනය සිදුවන ආකාරය හඳුන්වා ශ්‍රී ලංකාවේ මේ සඳහා පවතින අවස්ථා විචාරාත්මකව පෙන්වා දෙන්න. (ලකුණු 8)

9. i. අධ්‍යාපන ඵලදායිතාවට පවුලක් තුළින් ලැබෙන සමාජානුයෝජනය බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 7)

ii. දරුවෙකුට පවුලෙන් ලද සමාජානුයෝජනය පාසල තුළින් තවදුරටත් වර්ධනය කළ හැකි ආකාරය විස්තර කරන්න.

(ලකුණු 8)

10. i. සමාජ වෙනස්වීම් සඳහා අධ්‍යාපනය බලපාන ආකාරය විවිධ රටවල් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 7)

ii. ශ්‍රී ලංකාවේ අනාගත සමාජය වෙනස් කිරීම සඳහා අධ්‍යාපනයේ අඩංගු විය යුතු අංශ පිළිබඳව විමසන්න.

(ලකුණු 8)

O∘O∘O∘O∘O∘O∘O∘